# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2380/27 - 2024 අප්‍රේල් මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2024.04.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. (viii)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්තිය යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින් -

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "බඹරකැලේ ශ්‍රී මහා විහාරය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත්කරනු ලැබේ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ "බඹරකැලේ ශ්‍රී මහා විහාර භූමි ප්‍රදේශය" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධාන කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 අප්‍රේල් මස 09 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

### බඹරකැලේ ශ්‍රී මහා විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔය පළාත කොරළේ සුළු කොට්ඨාසයේ, බඹරකැලේ (කොට්ඨාස අංක 1 බඹරකැලේ, නුවරඑළිය මහ නගර සභා සීමාව තුළ) ගමෙහි පිහිටි, හෙක්ටයාර් 0.9967 ක් විශාලත්වයෙන් යුතු සර්වේයර් ජනරාල්ගේ 2018 නොවැම්බර් මස 28 දිනැති අංක NU/NEW/2017/348 දරන අනුරේඛනයේ හා සර්වේයර් ජනරාල්ගේ 2023 මැයි මස 30 දිනැති අංක NU/NEW/2017/348 (සංශෝධිත) පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුවේ කැබලි අංක A, B හා C වශයෙන් නිරූපිත පහත මායිම් වූ බිම් ප්‍රදේශය.

**කැබලි අංකඃ A පන්සලේ වත්ත (හෙක්ටයාර් 0.2336ක ප්‍රමාණයකින් සමන්විත වේ)**

*උතුරට* : මුපිනු 2288 හි කැබලි අංක 36, මුපිA 1064 හි කැබලි අංක 4 සහ 3

*නැගෙනහිරට* : මුපිA 1064 හි කැබලි අංක 3, 4 සහ මාර්ගය

*දකුණට* : මාර්ගය සහ කැබලි අංක B

*බටහිරට* : කැබලි අංක B සහ මුපිනු 2288 හි කැබලි අංක 36

**කැබලි අංකඃ B පන්සලේ වත්ත (හෙක්ටයාර් 0.7541ක ප්‍රමාණයකින් සමන්විත වේ)**

*උතුරට* : පඩිපෙළ, මුපිනු 2288 හි කැබලි අංක 36 සහ කැබලි අංක A

*නැගෙනහිරට* : කැබලි අංක A සහ මාර්ගය

*දකුණට* : මාර්ගය, කැබලි අංක D, E, C, F සහ G

*බටහිරට* : කැබලි අංක G, මුපිA 3187 හි කැබලි අංක 1, නමැති 42 හි පත්‍ර අංක 5 හි කැබලි අංක 48 සහ පඩිපෙළ

**කැබලි අංකඃ C (හෙක්ටයාර් 0.0090ක ප්‍රමාණයකින් සමන්විත වේ)**

*උතුරට* : කැබලි අංක B

*නැගෙනහිරට* : කැබලි අංක B සහ D

*දකුණට* : කැබලි අංක E, F සහ B

*බටහිරට* : කැබලි අංක B

EOG 04 - 0154/1

එල්.ඩී.බී. 94/47 (viii)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්තිය යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින් -

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "වෙහෙරගල රජමහා විහාරය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත්කරනු ලැබේ; සහ

(ආ) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ "වෙහෙරගල රජමහා විහාර භූමි ප්‍රදේශය" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 අප්‍රේල් මස 09 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

*වෙහෙරගල රජමහා විහාරය සංයුක්ත වන ප්‍රදේශය*

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාජවන්ති පත්තුව සුළු කොට්ඨාසයේ, වෙහෙරගල ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ 2002 දෙසැම්බර් මස 31 දින අංක 22 දරන අවසාන ගම් පිඹුරේ වෙහෙරගලවත්ත නමැති ඉඩමේ කැබලි අංක 4873 වශයෙන් නිරූපිත හෙක්ටයාර් 7.567 ක් විශාලත්වයෙන් යුතු පහත පරිදි මායිම් වූ ප්‍රදේශය -

**කැබලි අංකः 4873 - වෙහෙරගලවත්ත**

| | | |
|---|---|---|
| *උතුරට* | : | 4874 වැනි කැබැල්ල; |
| *නැගෙනහිරට* | : | වෙම්බුවැව (අවසාන ගම් පිඹුරේ 3475) හි ගම් මායිම සහ මාර්ග (ප්‍රාදේශීය සභා) - 4874 වැනි කැබැල්ලේ කොටසක්; |
| *දකුණට* | : | මාර්ග (ප්‍රාදේශීය සභා) - 4874 වැනි කැබැල්ලේ කොටසක්; |
| *බටහිරට* | : | 4874 වැනි කැබැල්ල; |

EOG 04 - 0151/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.